**ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුව**
**----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කම්කරු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍ර කාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් රු.100,272 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන විධිමත් අධීක්ෂණයකින් හා මගපෙන්වීමකින් යුතුව සකස් කල යුතු වීම. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට තොරතුරු ඇතුලත් කිරීමේදී සිදුවූ ප්‍රමාද දෝෂයක් මත මෙම වරද සිදුවී ඇත. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු වූ රු.8,810,550 ක් වූ මුදල වෙනත් වැය ශීර්ෂයක් වෙනුවෙන් කරන ලද වියදමක් නොවූවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ඇතුලත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කල යුතු වීම. | මූලය කාර්යසාධන ප්‍රකාශයට තොරතුරු ඇතුලත් කිරීමේදී සිදුවූ ප්‍රමාද දෝෂයක් මත මෙම වරද සිදුවී ඇති අතර, ඉදිරි වර්ෂවලදී මෙවැනි වැරදි සිදු නොවීම සඳහා අවශ්‍ය පියවර ගනු ලබන බවත් දන්වමි. |

### 1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වර්ෂයට අදාල අත්තිකාරම් ලැබීම් (බැර) ශේෂය රු.1,404,931 ක් ද අත්තිකාරම් ගෙවීම් රු.1,389,181 ක් ද අඩුවෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි නිවැරදි ශේෂ පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශ සකස් කල යුතු වීම. | භාණ්ඩාගාර ප්‍රකාශයට අනුව අත්තිකාරම් ගිණුමේ ලැබීම්වල ශේෂය රු.105,472,314 ක් වුවත් වර්ෂය තුල වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් කරන ලද වැරදි හර බැර කිරීම් නිවැරදි කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තු අත්තිකාරම් 'බී' ගිණුමට අනුව නිවැරදි බැර ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අත්තිකාරම් බී ගිණුමේ හර සහ බැර සටහන්වල එකතුවේ වෙනස හා භාණ්ඩාගාර ප්‍රකාශ අනුව එම වෙනස අක්මුදල් ගැලපුම් ගිණුමේ රු.116,021 ක් වැඩියෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කලයුතු වීම. | අවසාන භාණ්ඩාගාර මුද්‍රිත සටහනට අනුව වෙනත් දෙපාර්තමේන්තුවක් විසින් සිදුකර ඇති එක් බැර සටහනක් හඳුනාගැනීමට නොහැකි වූ බැවින් මෙම වෙනස ඇති වී තිබූ අතර එය පසුව එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

**1.6.4 අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශ අනුව රු.8,810,550 ක් වූ නොපිය වූ අග්‍රිම ශේෂයක් පැවතුණද මූල්‍ය ප්‍රකාශ අනුව එබඳු අග්‍රිම ශේෂයක් පෙන්වා නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව සහ පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව හැකිතාක් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කලයුතු වීම | සම්පින්ඩන වාර්තාවේ දක්වා ඇති උප අග්‍රිම ශේෂය වන රු.8,810,500 **ක** මුදල නොපිය වූ අග්‍රිම ලෙස පමණක් සටහන්ව තිබීම නිවැරදි කර ගැනීමට කටයුතු කරන අතර එම ශේෂය මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් මේ වන විට නිරවුල් කර ඇති බැවින් එයට අදාල අග්‍රිම ගිණුමේ ගැලපීම් ද සිදුකර ඇත. |

**1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව කම්කරු දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | ඉදිරියේදී 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් විධිවිධාන අනුව සහතිකවීම් ලබාදීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 09 කට අදාලව ප්‍රතිපාදිත මුදලින් ඉතිරිවීම් රු.366,510,771 ක් වූ අතර එය ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස සියයට 31 සිට 95 දක්වා පරාසයක විය. තවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයන් 06 කට අදාලව ප්‍රතිපාදිත මුදලින් ඉතිරිවීම් රු.208,629,686 ක් වූ අතර එය ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස සියයට 29 සිට 80 දක්වා පරාසයක විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතු වීම. | අයවැය චක්‍රලේඛ 04/2019 අනුව වියදම් සීමා කිරීම, ගොඩනැගිලි කුලී පදනමට ලබා නොගැනීම, මෙහෙවර පියස ගොඩනැගිල්ලට යාම ප්‍රමාද වීමෙන් වියදම් ඉතිරි වීම, 05/2019 අයවැය චක්‍රලේඛ ප්‍රකාර ඉතිරි කිරීම, ප්‍රසම්පාදන කටයුතු සීමා කිරීම ආදිය ඉතිරිය සඳහා හේතු වී තිබුණි. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් නොකල, බැරකම් ලේඛණයේ පැවති වැය විෂයය 03 කට අදාල බැරකම් වටිනාකම රු.2,181,270 ක් වී තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම පියවීමට ඇති බැරකම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කල යුතු බව. | අප දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, උපකාර්යාල, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල හා අනෙකුත් අංශවලින් බැරකම් ලෙස හඳුනාගෙන අප වෙත වාර්තා කරන ලද ඇතැම් බැරකම් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් නොකිරීම වෙනස්කම් සඳහා හේතු වී ඇත. |
| (ආ) මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය තුල ඇතුලත් කර තිබූ නමුත් බැරකම් ලේඛනයට ඇතුලත් කර නොතිබූ අවස්ථා 03 කට අදාල බැරකම් වටිනාකම රු.2,461,387 ක් විය. | -එම- | නිවැරදි පිළිතුරක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 3.4 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) හි බැදීම් හා | - එම - | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මගින් සේවක අර්ථසාධක අරමුදල් |

| | | |
|---|---|---|
| බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාර බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු වුවත් භාණ්ඩාගාර බැරකම් ප්‍රකාශය අනුව අංක 221-2-4-1-2509 දරණ වැය විෂය යටතේ වූ රු.1,743,840 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබූ අතර බැරකම් ලේඛනයේද දක්වා නොතිබුණි. | | අංශයේ E-ROC ව්‍යාපෘතිය සඳහා 195-02-03-13-2509 වැය විෂය යටතේ 2019 වර්ෂය සඳහා රු.2,100,000 ක් ප්‍රතිපාදන ලෙස අප දෙපාර්තමේන්තුව වෙත වෙන් කර ඇති අතර රු.356,160 ක වියදමද ඇතුළුව 2019 වර්ෂයේදී රු.1,980,077.32 ක මුදලක් වැය කර ඇත. |
| (ඇ) මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම වියදමකට හෝ බැරකමකට නොබැඳී සිටිය යුතු අතර ඒ වෙනුවෙන් වූ වියදම ප්‍රතිපාදන නොඉක්මවිය යුතුය. වැය විෂය අංක 221-2-4-1409 සඳහා රු.1,011,620 ක බැරකම් වලට එළඹ තිබූ අතර වර්ෂය අවසානයේ එම වැය විෂය යටතේ ඉතිරි වීම් රු.33,685 ක් පමණක් වීම නිසා ප්‍රතිපාදිත මුදල ඉක්ම වූ බැරකම් වටිනාකම රු.944,185 ක් වී තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් බැරකම්වලට එළඹීමේදී පවත්නා ප්‍රතිපාදන හා ප්‍රතිපාදන ඉක්මවීම පිළිබඳ විමසිලිමත් විය යුතු වීම. | අප දෙපාර්තමේන්තුව කලාප කාර්යාල 11 කින් ද දිස්ත්‍රික් කාර්යාල 40 කින් ද උප කාර්යාල 18 කින් ද දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 12 කින් ද අනෙකුත් අංශ 15 කින් ද ලෙස අංශ 96 කින් සමන්විත වේ. මෙම අංශ 96 තුල ප්‍රතිපාදන පාලනයේදී ප්‍රායෝගික අපහසුතා රාශියක් පැන නගින නමුත් ඉහත සියලුම අංශවල දෛනික කටයුතු අඛණ්ඩව පවත්වා ගෙනයාම අත්‍යවශ්‍ය වන බැවින් මෙලෙස කිරීමට සිදු වූ බව දන්වමි. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය ශේෂවල වටිනාකම රු. 5,127,856 ක් වූ අතර වසර 4 කට අධික කාලයක් අයකිරීම් සිදුකර නොතිබුණු ණය ශේෂවල වටිනාකම රු.1,789,294 කි. | වර්තමාන ණය ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කිරීම හා පැරණි ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය සියලු පියවර ගැනීම. | මෙම ණය ශේෂයන් අදාල නිලධාරීන් වෙත දැනුම් දීමෙන් හා ඊට අදාල ප්‍රාදේශීය ලේකම් මගින් මෙන්ම ග්‍රාම නිලධාරීන් මගින්ද නිලධාරියා දැනුවත් කර අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර එසේ අයකර ගත නොහැකි ණය ශේෂයන් අයකර ගැනීමට නීතිපති වෙතද යොමුකර ඇති බවත් දන්වමි. |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොදු තැන්පත් ගිණුමේ පවත්නා චෙක්වල දායක ගිණුම්වලට බැරකල යුතු සේවක අර්ථසාධක අරමුදල් ශේෂයෙන් 2019 ජුනි 30 දින වන විට රු.මිලියන 600 ක් නිරවුල් කිරීමට | පොදු තැන්පතු ගිණුමේ පවත්නා ශේෂ හඳුනාගෙන පුද්ගලික ගිණුම්වලට අප්‍රමාදව බැර කිරීමට කටයුතු කල යුතු වීම. | නඩු මගින් අයකර ගන්නා වාරික වශයෙන් එකතුවන මුදල්ද ඇතුලත් වන බැවින් සම්පූර්ණ මුදල එකතු වන තෙක් ගෙවීම් කිරීමට නොහැකි වීම, තැන්පත් මුදල් |

| | | |
|---|---|---|
| සැලසුම් කර තිබුණද රු.මිලියන 189 ක් පමණක් නිරවුල් කර තිබුණි. මේ නිසා පොදු තැන්පත් ගිණුමේ වර්ෂය තුල නිරවුල් කිරීමේ ප්‍රගතිය සියයට 31 ක් පමණක් විය. 2019 දෙසැම්බර් 31 දින වන විට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 793 ක් වූ අතර ඉන් වර්ෂ 05 වැඩි ශේෂවල එකතු වටිනාකම රු.මිලියන 128 ක් විය. | | හිමියන් විදේශගත වීම, මුදල් හිමිකරුවන් මියයාම හේතුවෙන් උරුමකරුවන් ඉදිරිපත් වන තෙක් සිටීම වැනි හේතු නිසා මෙම මුදල් ගෙවීම ප්‍රමාද වී ඇති අතර පසුගිය වර්ෂවල ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් අක්මුදල් භාණ්ඩාගාරයෙන් නොලැබුණු බවද දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 දෙසැම්බර් 31 දිනැති අංක 02/2017 දරන මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ 02 වගන්තියට පටහැනිව දෙපාර්තමේන්තුව භාවිතා කරන වාහන 02 ක් සම්බන්ධයෙන් ලියාපදිංචි අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ආයතනයේ සියලු වාහන ආයතනයේ නමින් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කිරීම. | අංක 60 – 6848 දරන වෑන්රථය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේද අංක 53 - 8847 දරන ඩබල් කැබ් රථය අප අමාත්‍යාංශය වෙතින්ද අප දෙපාර්තමේන්තුව වෙත වසර 25 කට ආසන්න කාලයක සිට ලබා දී ඇත. වාහන දෙකෙහිම ලියාපදිංචි සහතිකවල මුල් පිටපත් අප සතුව ඇති නමුත්, දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීමට අදාල ලියකියවිලි සොයාගැනීමට නොහැකි වී ඇත. මෙම වාහනය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට ඇති හැකියාව පිළිබඳ කටයුතු කරමින් පවතී. |
| (ආ) 2015 ජූලි 01 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 02/2015 දරණ චක්‍රලේඛයෙහි පෙන්වා දී ඇති පරිදි රාජ්‍ය ආයතනය සතු අබලන් වූ හා භාවිත කිරීමට නෙහැකි වාහන අපහරණය කිරීම සඳහා කටයුතු කලයුතු වුවත් 2019 සැප්තැම්බර් 19 දින වන විටත් දෙපාර්තමේන්තුව සතු අබලන් වූ වාහන 05 ක් අපහරණය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | භාවිතා කල නොහැකි වාහන අබලි ලෙස හඳුනාගැනීම හා ඒවා ඉවත් කිරීම චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කරමින් කටයුතු සිදුකල යුතු වීම. | අබලන් වූ වාහන අපහරණය සඳහා වන තක්සේරු කමිටුව වෙත යොමුකර ඇති අතර, එම කමිටුවේ වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් විගණනය විසින් ලබාගන්නා ලද විස්තර අනුව කම්කරු කොමසාරිස් ජනරාල් නමට ලියාපදිංචි කර තිබූ වාහන 22 ක් දැනට දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි. එම වාහනවල පැවැත්ම හා භාවිතය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුනි. | දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර ඇති වාහන පිළිබඳ වගකීම දෙපාර්තමේන්තුව සතු වන නිසා මේ පිළිබඳ සොයාබලා අවශ්‍ය කටයුතු කල යුතු වීම. | මෙම වාහන සම්බන්ධව කිසිදු ලියවිල්ලක් අප දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා බස්නාහිර පලාත් මෝටර් රථ දෙපාර්තමේනතුව මගින් තොරතුරු විමසූ අතර මෙම වාහන භාවිතයේ නොමැති බැවින් පසුගිය වසර 15 ක පමණ කාලයක සිට ආදායම් බලපත්‍ර නිකුත්වීමක් සිදුවී නොමැති බවට තහවුරු විය. එසේම මෙම වාහන සියල්ලම 1995 වර්ෂයට පෙර නිෂ්පාදිත හා ලියාපදිංචි කර ඇති වාහන වන අතර මෙම දෙපාර්තමේන්තුවේ මිනිස්බල අංශය 1995 දී වෘත්තීය පුහුණු අධිකාරිය ලෙසට ඉවත් වී යාමේදී මෙකී වාහන රැගෙන ගියේද යන්න සොයා බැලීම සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් තොරතුරු විමසා ඇති බවත් දන්වමි. |
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ඉදිකිරීම සඳහා 2017 අප්‍රේල් 07 දින මුල්ගල තබා තිබුණි. නමුත් ඉඩම පවරාගැනීමේ ගැටලු හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කර තිබූ අතර 2020 ජුනි 15 වන විටත් එහි කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි. | ඉඩම් අයිතිය විධිමත්ව පවරා ගැනීමෙන් පසු ඉදිකිරීම් කලයුතු වීම. | අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලැබී තිබුණු නමුත් ඉඩම පවරා ගැනීමේ ගැටලු හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කරන ලදී. |
| (ඉ) | ඇස්තමේන්තුගත පිරිවැය රු.268,170,000 ක් වූ බදුල්ල දිස්ත්‍රික් නව කම්කරු කාර්යාලය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩමක ඉදිකිරීම ආරම්භ කර ඇති නමුත් අදාල ඉඩම විධිමත් පරිදි දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු.54,791,204 ක මුදලක් 2018 දෙසැම්බර් 31 දින වන විට ලබාදී තිබූ අතර 2019 පෙබරවාරි 06 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් කටයුතු පවරාදී තිබුණි. | ඉඩමේ අයිතිය නිරවුල්ව පවරා ගන්නා තෙක් ඉදිකිරීම් කටයුතු සිදුකිරීම ගැටලුකාරී තත්වයක් ඇති විය හැකි බැවින් ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ඉඩම් අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කලයුතු වීම. | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් අප දෙපාර්තමේන්තුව වෙත ඉඩම පවරාදීමට එකඟතාවය පළකර තිබූ අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලැබී ඇත. මේ නිසා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික ප්‍රතිපාදන ලෙස රු.54,791,203 ක මුදලක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත නිදහස් කරන ලදී. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතුද මේ වන විට සිදුකරන අතර ප්‍රස්තුත ඉඩම පවරා ගැනීමේ කටයුතුද තවදුරටත් සිදුකරමින් පවතින බවත් දන්වමි. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය, නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලය හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය යන කාර්යාල, පවත්වාගෙන ගිය තෙමහල් ගොඩනැගිල්ලට යාබදව පිහිටි ''කුමරි කන්ද'' නායයාම නිසා 2018 ජනවාරි 15 දින සිට එම කාර්යාලයේ කොටසක් පෞද්ගලික ගොඩනැගිල්ලකට ගෙනයාමට සිදුව තිබුණි. රු.මිලියන 27 ක් වැයකර වර්ෂ 9 කට පෙර ගොඩනැගිල්ල ඉදිකර තිබුණු නමුත් ගොඩනැගිලි සැලැස්ම මෙතෙක් අනුමත කර ගැනීමටද නොහැකි වී තිබුණි . කන්ද අස්ථායීවීමට මූලික හේතුව ගොඩනැගිල්ල ඉදිකිරීමේදී මීටර් 150 ක් පමණ අක්‍රමවත් තිරස් කැපුමක් සිදුකිරීම බව ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් නිකුත්කර තිබූ වාර්තාවක් මගින් හඳුනාගෙන තිබුණි. ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී හා ඉදිකිරීමේදී සිදු වූ මෙම නොසැලකිල්ල හේතුවෙන් දෙපාර්තමේන්තුවට අයත් වර්ග අඩි 4622.7 ක් වූ කාර්යාල වපසරියක් වසර 02 ක කාලයක සිට නිශ්කාර්යව පවතින බවත් 2018 ජනවාරි 15 දින සිට 2019 නොවැම්බර් 26 දක්වා පමණක් ගොඩනැගිලි කුලී ලෙස රු.මිලියන 3.3 ක් වැයකර තිබුණු බවත් නිරීක්ෂණය විය. | අපේක්ෂිත කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම සඳහා ප්‍රශස්ථ තීරණ ගත යුතුවේ. | ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අදාල සැලසුම් කළුතර නගර සභාවට ඉදිරිපත් කර ඇත. ගොඩනැගිල්ල ඉදිකිරීමට ඉඩකඩ ලබා ගැනීම සඳහා කන්දෙන් 150m ප්‍රමාණයක කැපීමක් කර නොමැති බව ගොඩනැගිල්ල සඳහා සකස් කල ප්‍රමාණපත්‍රය අනුව පැහැදිලි වේ. මේ අනුව කන්ද කපන ලද්දේ කුමන අවස්ථාවකද යන්න පැහැදිලිව හඳුනාගත නොහැක.. |
| (ආ) | අධිකරණ මාර්ගයෙන් හා කම්කරු කාර්යාල මාර්ගයෙන් අයකරගත් 2019 දෙසැම්බර් 31 දිනට සේවකයන් වෙත නිරවුල් නොකර පැවති සේවක අර්ථසාධක අරමුදල් ශේෂය රු.398,465,065 ක් විය. ඉන් 2020 ජූනි 24 දින වන විටත් නිරවුල් නොකර පැවති ශේෂය රු.332,429,832.35 ක් විය. | සේවකයන් වෙනුවෙන් අයකරගත් මුදල් ඔවුන්ගේ ගිණුම් වෙත අප්‍රමාදව බැරකල යුතු වේ. | දෙපාර්තමේන්තු වාර්තා අනුව පොදු තැන්පත් ගිණුමේ 2019.12.31 දිනට සේවක අර්ථසාධක අරමුදල් ශේෂය රු.398,465,065.84 විය. එයින් රු.66,035,233.49 ක් නිරවුල් කොට ඇති අතර 2020.06.24 දින වන විට තවදුරටත් රු.332,429,832.35 ක ශේෂයක් පවතින බව සඳහන් කරමි. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොළඹ දිස්ත්‍රික්කයට අයත් කම්කරු කාර්යාල 02 ක 'සී' වාර්තා සේවක අර්ථසාධක අරමුදල වෙත ලබාදීමට හෝ කම්කරු කාර්යාල විසින් අයකරගත් රු. 2,088,427 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය කිරීමට ප්‍රමාද වූ අවස්ථා 07 ක් නිරීක්ෂණය වූ අතර එම ප්‍රමාද කාලය මාස 05 ත් අවු. 03 ත් අතර කාල පරාසයක් ගෙන තිබුණි. | කම්කරු කාර්යාල මගින් හෝ අධිකරණය මගින් අයකරගත් මුදල් කඩිනමින් එකී ප්‍රතිලාභීන් වෙත කාලීනව ලැබෙන බව තහවුරු වන ප්‍රශස්ථ ක්‍රමවේදයක් තුල කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතු වීම. | අධිකරණය වෙත ගෙවනු ලබන චෙක්පත් එවීම සඳහා තැන්පත් කල මාසයේ සිට ඉදිරියට මාස දෙකක පමණ කාලයක් ගතවන අවස්ථාද පවතී. එසේ ලැබුණු චෙක්පත පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කරනු ලබන අතර සී වාර්තාවේ හෝ රික්විසිෂන් පත්‍ර ලබා ගැනීම පිණිස අධිකරණයෙන් ලබාගන්නා තොරතුරු අදාල දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලට යොමු කරනු ලබයි.<br>එම විස්තර විවිධ හේතු මත මෙම අංශයට එවීමට ප්‍රමාද වන අවස්ථා පවතින අතර සේවා යෝජක වෙතින් ලබාගත් සී වාර්තාවල පවතින අඩුපාඩු සකස් කර එවීමට යම් කාලයක් ගතවීම ඊට හේතුවන අවස්ථාද පවතී. |
| (ආ) | නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලය වෙත 2019 වර්ෂය තුළදී අවස්ථා 6 කදී අධිකරණයෙන් එවා තිබූ රු.630,520 ක මුදලක් දායක ගිණුම්වල තැන්පත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම සඳහා අවශ්‍ය බැර වාර්තා සහ 'සී' වාර්තා 2019 දෙසැම්බර් 13 දින වන විටත් සේ.අ.අ. වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කම්කරු කාර්යාල මගින් අයකරගත් මුදල් කඩිනමින් එකී ප්‍රතිලාභීන් වෙත කාලීනව ලැබෙන බව තහවුරු වන ප්‍රශස්ථ ක්‍රමවේදයක් හඳුන්වා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතු බව. | මුදල් එවනු ලබන අධිකරණ වලට අදාල දිස්ත්‍රික් කම්කරු කාර්යාල මගින් සී වාර්තා හෝ රික්විසිෂන් පත්‍ර යොමු කිරීමෙන් පසු අදාල පාර්ශවයන්ට චෙක්පත් යොමු කරනු ලබයි. ප්‍රමාදවීම් සිදුවන්නේ සේ.අ.අ. දායක මුදල් වලට අදාල සී වාර්තා එවීම සඳහායි.<br>වර්තමානයේදී දායක මුදල් හා ඊට අදාල සී වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීම සිදුකරනුයේ 2015 අගෝස්තු මස සිට ක්‍රියාත්මක වන සමානුපාතික ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදය අනුවයි. |
| (ඇ) | කම්කරු පරීක්ෂණ අවස්ථාවේදී සී වාර්තා, දිස්ත්‍රික් 66 වාර්තා, වැටුප් ලේඛන හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දායක මුදල් ගිණුම්ගත කල බවට ආයතනය වෙත දන්වන වාර්තා යනාදී ලියවිලි කම්කරු නිලධාරී විසින් | මහ බැංකුවේ පවත්නා තොරතුරු පද්ධතිය හා සමගාමී වන තොරතුරු පද්ධතියක් නොමැති වීම නිසා මෙම ප්‍රමාදයන් හා පරස්පරතාවයන් සිදුවන බව නිරීක්ෂණය වේ. | සේවක ගිණුම වෙත හිඟ මුදල් බැර කිරීමට කටයුතු කිරීමේදී තොරතුරු නොගැලපීම හා පරස්පරතාවයක් නිරන්තරයෙන් සිදුවන කරුණකි. පසුගිය වර්ෂ කිහිපයක නිරීක්ෂණය කරන ලද මෙවැනි අඩුපාඩු සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ |

| | | | |
|---|---|---|---|
| | ලබාගත යුතුය. එම තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකු දත්ත පද්ධතියේ තොරතුරු හා නොගැලපීම, ගණනය කල හිඟ මුදල් ආයතනයෙන් ලබාගත් සී වාර්තා හා වැටුප් ලේඛන සමඟ නොසැසඳීම, අධිකරණයෙන් එවූ බැර වාර්තා හිඟ ගණනයන් සමඟ නොගැලපීම, කම්කරු කාර්යාලය නිකුත් කරන ආවරණ ලිපිය හා හිඟ දායක මුදල් පරස්පර අගයන් ගැනීම ආදී හේතු නිසා මෙලෙස අයකර ගත් මුදල් සේවකයාගේ දායක ගිණුම් වෙත බැර කිරීමට නොහැකිව පැවති අවස්ථා 19 ක් නිරීක්ෂණය විය. එම අවස්ථා වලදී හිඟ මුදල් ගිණුම්ගත නොවී පැවති කාල පරාසය වර්ෂ 1 ත් 19 ත් අතර විය. | දෙපාර්තමේන්තුව විසින්ද එවැනි තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමුකල යුතු වීම. | පවත්වන ලද පුහුණු වැඩසටහන්වලදී අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකර අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ පවතින්නේ සේවායෝජකයින් විසින් සෘජුවම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමුකරන ලද තොරතුරු වේ. කම්කරු කාර්යාල මගින් යොමු කරනු ලබන සී වාර්තාවල තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු නොගැලපෙන බව සඳහන් කර එවනු ලබන අවස්ථාවලදී ශ්‍රී ලංකා මහ බැංකු තොරතුරු පද්ධතියේ පවතින නාමාංක නිවැරදි නොවන අවස්ථා ද පවතී. මේ නිසා මෙවැනි අඩුපාඩු සකස් කිරීමේදී ඉතා පරීක්ෂාකාරීව සිදුකල යුතු බැවින් සමහර නිවැරදි කිරීම් සඳහා වැඩි කාලයක් ගතවේ. |
| (ඇ) | දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 06/2011 හි 02 ඡේදය ප්‍රකාරව පෙත්සම් / පැමිණිලි ලැබී දින 14ක් තුල විභාග කලයුතු වුවද “මහානාම ට්‍රේඩ් සෙන්ටර් - මොරටුව” සම්බන්ධයෙන් වූ පරීක්ෂණය සිදුකර තිබුණේ පෙත්සම ලැබී මාස 04 කට පසුවය. එකී පෙත්සම සඳහා දිස්ත්‍රික් 66 වාර්තාව අනුව රු. 824,600 ක් ගෙවන ලෙස නීතික්‍රියා 01/02 නිවේදන යවා තිබුණේ මාස 06 ක ප්‍රමාද කාලයකට පසුවය. මෙම ආයතනය 2004 ජූලි 25 දින තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කර තිබුණද සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි කර තිබුණේ මෙම පෙත්සමේ පරීක්ෂණ කටයුතු සිදු කරන 2018 වර්ෂයේදී වේ. මෙම ආයතනය කම්කරු නිලධාරීන් වරින් වර පරීක්ෂාවට ලක් කර තිබුණද වසර 14 ක් ගතවන තුරු එකී ආයතනය සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි කර නොතිබුණු බව නිරීක්ෂණය විය. 2016 වර්ෂයේ සිට මෙම ආයතනයේ සේවකයින් | මහජන පෙත්සම් හා පැමිණිලි සම්බන්ධව කඩිනමින් ක්‍රියාකර දෙපාර්තමේන්තුව තුලින් මහජනයා බලාපොරොත්තුවන සේවාව කාර්යක්ෂමව හා කාලීනව සලසාදීමට හැකි සෑම පියවරක්ම ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා ඇතුලු කාර්යමණ්ඩලය කටයුතු කල යුතු බව | ජනාධිපති කාර්යාලය, කම්කරු අමාත්‍යාංශය ඇතුලු විවිධ රාජ්‍ය ආයතනයන් තුලින් ලැබෙන පැමිණිලි සඳහා ප්‍රමුඛව කටයුතු කලයුතු බැවින් එකී ගොනුවලට අදාලව ප්‍රමුඛතාවයක් ලබාදීම සිදුකරයි. දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ පුරප්පාඩුව පැවතීම, දෙපාර්තමේන්තුව විසින් 30% ප්‍රතිලාභ නිදහස් කිරීමද ආරම්භ කර තිබූ බැවින් සාමාජිකයින් දෛනිකව විශාල වශයෙන් B පත්‍ර ලියාපදිංචි සිදුකිරීම යනාදිය නිසා මෙම නිලධාරිනිය අතිශය කාර්ය බහුලත්වයට පත්වීම නිසා මෙයට අදාලව යම් ප්‍රමාදයක් සිදුවී ඇති බව දන්වමි.<br>කම්කරු නිලධාරීන් විසින් ආයතන පරීක්ෂා කිරීමට ලක් කලද සේවායෝජක තොරතුරු වසන් කිරීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි කිරීමට දුෂ්කර වන අවස්ථා පවතී. එමෙන්ම සේවකයින් දීර්ඝ කාලයක් කරුණු වසන් කිරීමට අනුබල දෙමින් සිට සේවය අවසන් කල අවස්ථාවේ පැමිණිලි කිරීම මෙන්ම දෙපාර්ශවය විසින් සිදුකරන දින අයදීම් මතද පරීක්ෂණයකට ගතවන කාලය දීර්ඝ |

| | | |
|---|---|---|
| අවස්ථා කිහිපයකදී පෙත්සම්/ පැමිණිලි මගින් සේවක අර්ථසාධක අරමුදල් / පාරිතෝෂික හා වන්දි ඉල්ලා තිබුණද එකී පැමිණිලිකාර පාර්ශවයට සහනයක් ලබාදීමට ඉල්ලීම් කර වසර 03 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබුණද ඒ සඳහා සහනයක් සැලසීමට කම්කරු දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | | වීම සිදුවේ. එවකට පැවති කම්කරු නිලධාරීන්ගේ හා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ පුරප්පාඩුද විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කිරීමට තිබූ ඉඩ ප්‍රස්ථා සීමා කල සාධකයක් වූ බවත් කාරුණිකව දන්වමි. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාව තුළ පිහිටි සියලුම රාජ්‍ය නොවන ආයතන/ වතු පරීක්ෂා කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව යටතේ කලාප කාර්යාල 11 ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක්, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක් ස්ථාපිත කර තිබුණි. මෙම කාර්යය ඉටු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට අනුමත කර තිබෙන කම්කරු නිලධාරී තනතුරු සංඛ්‍යාව 597 ක් හා අධිශ්‍රේණි තනතුරු 56 ක් විය. මේ අතරින් අධිශ්‍රේණි තනතුරු 56 අනුමත වී තිබුණද, ප්‍රතිව්‍යුහකරණ කටයුතු හේතුවෙන් 2019 වර්ෂය අවසානය වන විටත් එම තනතුරු පුරප්පාඩුව පැවති අතර කම්කරු නිලධාරී තනතුරු 97 ක් ද දිගු කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත කාර්යභාරයෙන් වඩාත් සුමට හා කාර්යක්ෂම ලෙස ක්‍රියාවේ යෙදවිය හැකි ලෙස මානව සම්පත ප්‍රශස්ථ හා කාර්යක්ෂමව පවත්වාගෙන යෑමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | කම්කරු නිලධාරී (විශේෂ ශ්‍රේණියේ) බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ ලබා ගැනීම සඳහා මගේ අංක DL/E/3/58 හා 2019 දෙසැම්බර් 26 දිනැති ලිපිය යොමුකර ඇත. එම බඳවාගැනීමේ පටිපාටිය අනුමතවීමෙන් පසුව කම්කරු නිලධාරී (විශේෂ ශ්‍රේණියට) පත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ විශේෂඥ කර්මාන්තශාලා ඉංජිනේරු තනතුරු 03 ම පුරප්පාඩුව පැවති අතර දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක තනතුරු 10 න් 4 ක් ද, කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තනතුරු 14 න් 2 ක් ද පුරප්පාඩු වී තිබෙන නමුත් 2019 දෙසැම්බර් 31 වන විටද මෙම | දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත කාර්යභාරයෙන් වඩාත් සුමට හා කාර්යක්ෂම ලෙස ක්‍රියාවේ යෙදවිය හැකි ලෙස මානව සම්පත ප්‍රශස්ථ හා කාර්යක්ෂමව | කර්මාන්ත සුරක්ෂිතතා අංශයෙහි මෙම විගණන විමසුමේ දක්වා ඇති තනතුරුවලට අමතරව අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ඉංජිනේරු), කම්කරු කොමසාරිස් මෙම අංශයේ පවතින ඉංජිනේරු පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පලාත් සභා හා |

| | | |
|---|---|---|
| තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි. | පවත්වාගෙන යෑමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | පලාත් පාලන අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇති PACIS මෘදුකාංගය, එහි සඳහන් පරිදි කාර්ය මණ්ඩලය එම මෘදුකාංගය ඔස්සේ යාවත්කාලීන කිරීම දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවා පුරප්පාඩු පිරවීමේදී අනිවාර්යයෙන්ම සැලකිල්ලට ගනු ලබන බව සටහන් කර ඇත. ඒ අනුව 2016/05 වන මාසයේ සිට මේ දක්වා සෑම මාසයකම මෙම දත්ත පද්ධතිය යාවත්කාලීන කර ඇත. ඊට අමතරව ඉංජිනේරු පුරප්පාඩු සේවයේ පුරප්පාඩු පිළිබඳව 2018.03.08 හා 2019.02.07 දිනැති ලිපි මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. |